සියළුම දිස්ත්‍රික් ලේකම් / දිසාපතිවරුන් මගින්
පුහුණු ශ්‍රේණියේ කාර්මික නිලධාරීන් / නිලධාරිණියන් වෙත

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු ශ්‍රේණියේ කාර්මික නිලධාරීන් III ශ්‍රේණියට පත් කිරීම සඳහා වන විභාගය - 2014**

2013 හා 2014 වර්ෂ වල රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා බඳවාගත් සියළුම පුහුණු ශ්‍රේණියේ කාර්මික නිලධාරීන්/ නිලධාරිණියන් පුහුණු ශ්‍රේණියේ වසරක කාලයක් සම්පූර්ණ වන දින සිට III වන ශ්‍රේණියට පත් කිරීම සඳහා විභාගය 2014 ජුනි මස පවත්වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. (2006.10.02, 2006.11.01 සහ 2011.06.20 දිනයන් වල බඳවා ගත් මීට පෙර පැවති III වන ශ්‍රේණියට පත්කිරීම සඳහා පවත්වන ලද විභාග වලින් සුදුසුකම් නොලද නිලධාරීන් ද අනිවාර්යයෙන් මෙම විභාගයට පෙනී සිටිය යුතු අතර මෙය ඔවුන් සඳහා ලැබෙන අවසාන අවස්ථාව වේ.)

02. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ලේකම් විසින් මෙම විභාගය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේදී පැවැත්වීමට කටයුතු යොද ඇත.

03. විභාගයට පෙනී සිටින පුහුණු ශ්‍රේණියේ කාර්මික නිලධාරීන් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අයදුම්පතක් සකස්කර දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් මගින් **2014.05.30** දිනට පෙර **ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (දිස්ත්‍රික් පාලන), රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදල තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

04. අපේක්ෂකයින් විභාග ශාලාව තුලදී පෙනී සිටින සෑම විෂයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය
3. වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අනන්‍යතාවය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ලේකම්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.